# ප්‍රසම්පාදන දැන්වීමයි

## අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

## සබරගමුව පළාත් සභාව

**සබරගමුව පළාත් සභාවේ අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පළාත් නිශ්චිත කාර්ය සංවර්ධන ප්‍රදාන වැඩසටහන යටතේ ( PSDG ) කර්මාන්ත 09 ක් , පාසල් ගොඩනැගිළි නඩත්තු වැඩසටහන ( RECURRENT ) යටතේ කර්මාන්ත 02 ක් සහ ළගම පාසල හොදම පාසල වැඩසටහන යටතේ ( NSBS ) කර්මාන්ත 04 ක් ඉටුකිරීම සදහා මිළ ගණන් කැඳවනු ලැබේ.**

**01.** මෙම කර්මාන්ත ලේඛනය හා වැඩි විස්තර **www.sg.gov.lk** වෙබ් අඩවියතුල ඇති ටෙන්ඩර් දැන්වීම් වෙබ් පිටුව වෙත පිවිස හෝ **www.moe.sg.gov.lk** යන අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් පිටුවට පිවිස ලබාගත හැකිය.

**02.** පළාත් නිශ්චිත කාර්ය සංවර්ධන ප්‍රදාන වැඩසටහන **(PSDG)** ව්‍යාපෘතිය යටතේ පහත සදහන් කර්මාන්ත 09 ට , පාසල් ගොඩනැගිළි නඩත්තු වැඩසටහන ( RECURRENT ) යටතේ කර්මාන්ත 02 ට සහ ළගම පාසල හොදම පාසල වැඩසටහන යටතේ **(NSBS)** කර්මාන්ත **04** ට අදාලව ලංසු කැදවීම, ජාතික තරගකාරී ලංසු කැදවීම අනුව සිදුකරනු ලැබේ. ඒ ඒ කර්මාන්තය යටතේ ඉදිරිපත්වන ලංසුකරුවන් එහි **සදහන් CIDA ලියාපදිංචි ශ්‍රේණිවලට අයත්වන ලංසු විවෘතකරන දිනට ලියාපදිංචිය වලංගුවන** ලංසු කරුවන් විය යුතුය.

**03.** ඉහත කර්මාන්තයන්ට අදාළ ප්‍රසම්පාදන ලේඛන **2025.05.27** දින සිට **2025.06.16** දින දක්වා, සතියේ වැඩ කරන දින වල **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00** දක්වා අදාල ගාස්තු ගෙවීමෙන් පසු නිකුත්කරනු ලැබේ.මෙම ප්‍රසම්පාදන ලේඛන මෙම දිනවලදී කාර්යාල වේලාවන්තුල මෙම අමාත්‍යාංශයේදී නොමිලේ පරික්ෂාකර බැලිය හැකිය.

**04.** සියලුම ලංසුකරුවන් එක් එක් ඉදිකිරීම් සදහා එම කර්මාන්ත ඉදිරියෙන් සදහන් ලංසු බැදුම්කර වටිනාකමට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි,පිළිගත් වාණිජ බැංකුවකින් **2025.06.18 දින සිට 2025.10.21** දින දක්වා වලංගුවන පරිදි **ලේකම්,අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.සබරගමුව පළාත් සභාව. නව නගරය,රත්නපුර** නමින් අදාල කර්මාන්තය නමට ලබාගත් ලංසු බැදුම්කරයක් හෝ ලංසු සුරක්ෂණ මුදල ලෙස **අමාත්‍යාංශ ලේකම් වෙත අදාළ මුදල් තැන්පත් කර ලබා ගත් රිසිට් පත , ලංසුව සමග ලංසු බැදුම්කරය ලෙස ඉදිරිපත් කළ යුතුය. ලංසු බැදුම්කරය ඉදිරිපත් කිරීමේ දී මුදල් ගෙවා ලබාගන්නා රිසිට් පතෙහි හෝ ලංසු සුරක්ෂණයෙහි මුල් පිටපත අනිවාරයෙන්ම ඉදිරිපත්කළ යුතුය.**

සම්පූර්ණ කරන ලද **එම කර්මාන්තයන්ට අදාල ලංසු 2025.06.18 වන දින පෙ.ව.11.00 ට** පෙර ලැබෙන සේ පහත ලිපිනයට **ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ සබරගමුව පළාත් සභා සංකීර්ණයේ පළමු මහලේ පිහිටි අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම** කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. **මිල ගණන් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ කර්මාන්තයේ නම සඳහන් කළ යුතුය. සෑම ටෙන්ඩරයක් සඳහාම මුල් පිටපත/අනුපිටපත යන්න කවරයේ සඳහන් කර වෙනම කවරයක බහා ඉදිරිපත් කළ යුතුය.**

**05.** **ලංසු පත් විවෘත කිරීම 2025.06.18** වන දින **පෙ.ව.11.00** ට **සිදුකරනු ලබන අතර, ලංසු කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගී විය හැකිය**.

**06.** මෙම ලංසු කැඳවීම සම්බන්ධයෙන් පැන නගින ඕනෑම ගැටළුවක් සම්බන්ධයෙන් කාර්යාල වේලාවන් තුළදී අවශ්‍ය විස්තර අමාත්‍යාංශ කාර්යාලයෙන් දුරකතන අංක **045 -2222542**, ෆැක්ස් **045-2228042** සහ ඊමේල්

**edusabaram@gmail.com** මගින් ලබා ගත හැකිය. ටෙන්ඩර් පත් සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති සතු වේ.

**පළාත් නිශ්චිත කාර්ය සංවර්ධන ප්‍රදාන වැඩසටහන යටතේ ( PSDG ) කර්මාන්ත 09 ක් ඉටුකිරීම සඳහා මිළ ගණන් කැඳවීම**

.

| අනු අංකය | වැඩ විස්තරය | විධායක ඉංජිනේරු කාර්යාලය | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු රු. | ලංසු බැඳුම්කර වටිනාකම රු. | ඉල්ලුම් කල හැකි ලියාපදිංචි ශ්‍රේණිය | ඇස්තමේන්තු ගත වැඩ වටිනාකම රු.මි. |
|---|---|---|---|---|---|---|
| 01 | ර/ධර්මපාල මහා විද්‍යාලයේ 140*45 සිවු මහල් පාසල් ගොඩනැගිල්ල තෙවන අදියර ඉදිකිරීම. | රත්නපුර | 12,500.00 | 690,000.00 | C-5 සහ ඉහල | 69.00 |
| 02 | ර/අල්මකියා මුස්ලිම් මහා විද්‍යාලයේ 80*35 තෙමහල් ප්‍රථමික ඉගේණුම් සම්පත් මධ්‍යස්ථානය තෙවන අදියර ඉදිකිරීම. | රත්නපුර | 7,500.00 | 214,000.00 | C-6 සහ ඉහල | 21,44 |
| 03 | ර/ඇඹි/ඇඹිලිපිටිය මහා විද්‍යාලයේ 110*25 තෙමහල් පාසල් ගොඩනැගිල්ල පලමු අදියර ඉතිරි වැඩ ඉදිකිරීම. | ඇඹිලිපිටිය | 7,500.00 | 241,000.00 | C-6 සහ ඉහල | 24.19 |
| 04 | ර/ඇඹි/රාජකීය විද්‍යාලයේ ක්‍රීඩා පිටිය රැඳවුම් බැම්ම ඉදිකිරීම සමඟ සංවර්ධනය කිරීම. | ඇඹිලිපිටිය | 7,500.00 | 106,000.00 | C-7 සහ ඉහල | 10.61 |
| 05 | කෑ/දෙහි/කදිරේශන් දෙමළ විද්‍යාලයේ 70*25 දෙමහල් පාසල් ගොඩනැගිල්ල දෙවන අදියර ඉදිකිරීම | දෙහිඕවිට | 7,500.00 | 114,000.00 | C-7 සහ ඉහල | 11,41 |
| 06 | කෑ/දෙහි/කදිරේශන් දෙමළ ප්‍රාථමික විද්‍යාලයේ 110*25 තෙමහල් පාසල් ගොඩනැගිල්ල තෙවන අදියර ඉදිකිරීම | දෙහිඕවිට | 7,500.00 | 220,000.00 | C-6 සහ ඉහල | 22,05 |
| 07 | කෑ/දෙහි/සහිරා මුස්ලිම් විද්‍යාලයේ 90*25 තෙමහල් පාසල් ගොඩනැගිල්ල දෙවන අදියර ඉදිකිරීම | දෙහිඕවිට | 7,500.00 | 142,000.00 | C-7 සහ ඉහල | 14,23 |
| 08 | කෑ/දෙහි/පන්නල මහා විද්‍යාලයේ 90*25 දෙමහල් පාසල් ගොඩනැගිල්ල ඉතිරිවැඩ ඉදිකිරීම. | දෙහිඕවිට | 7,500.00 | 118,000.00 | C-7 සහ ඉහල | 11,78 |
| 09 | කෑ/මාව/රන්දිවෙල මහා විද්‍යාලයේ 90*25 තෙමහල් පාසල් ගොඩනැගිල්ල තෙවන අදියර ඉදිකිරීම | මාවනැල්ල | 7,500.00 | 115,000.00 | C-7 සහ ඉහල | 11,50 |

**පාසල් ගොඩනැගිලි නඩත්තු වැඩසටහන යටතේ ( Recurrent ) කර්මාන්ත 02 ක් ඉටුකිරීම සඳහා මිළ ගණන් කැඳවීම**

| අනු අංකය | වැඩ විස්තරය | විධායක ඉංජිනේරු කාර්යාලය | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු රු. | ලංසු බැදුම්කර වටිනාකම රු. | ඉල්ලුම් කල හැකි ලියාපදිංචි ශ්‍රේණි | ඇස්තමේන්තු ගත වැඩ වටිනාකම රු.මි. |
|---|---|---|---|---|---|---|
| Re -01 | ර/කුඩාව විද්‍යාලයේ හානිවී ඇති පාසල් ගොඩනැගිල්ල අළුත්වැඩියාකිරීම හා 50*25 කාර්යාල කාමරය වැඩිදියුණුකිරීම | රත්නපුර | 7,500.00 | 107,000.00 | C-7 සහ ඉහල | 10,73 |
| Re -02 | ර/ඇඹි/ශාන්ත අන්තෝනි මහා විද්‍යාලයේ පැරණි දෙමහල් ගොඩනැගිල්ල අළුත්වැඩියාකිරීම හා ආරක්ෂිත රුදවුම් බැම්ම ඉදිකිරීම | පැල්මඩුල්ල | 7,500.00 | 289,000.00 | C-6 සහ ඉහල | 28,87 |

**ළගම පාසල හොදම පාසල වැඩසටහන යටතේ (NSBS) කර්මාන්ත 04 ක් ඉටුකිරීම සඳහා මිළ ගණන් කැඳවීම**

| අනු අංකය | වැඩ විස්තරය | විධායක ඉංජිනේරු කාර්යාලය | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු රු. | ලංසු බැදුම්කර වටිනාකම රු. | ඉල්ලුම් කල හැකි ලියාපදිංචි ශ්‍රේණි | ඇස්තමේන්තු ගත වැඩ වටිනාකම රු.මි. |
|---|---|---|---|---|---|---|
| Ns-01 | කෑ/දෙහි/පඹේගම දෙමළ විද්‍යාලයේ 80*20 තනිමහල් පාසල් ගොඩනැගිල්ල ඉතිරි වැඩ ඉදිකිරීම | දෙහිඕවිට | 3,500.00 | 88,000.00 | C-8 සහ ඉහල | 8,81 |
| Ns-02 | කෑ/දෙහි/සරස්වතී දෙමළ විද්‍යාලයේ 80*25 දෙමහල් ගොඩනැගිල්ල ඉතිරි වැඩ ඉදිකිරීම | දෙහිඕවිට | 7,500.00 | 180,000.00 | C-6 සහ ඉහල | 18,09 |
| Ns-03 | කෑ/දෙහි/කැන්දල්ඔය දෙමළ විද්‍යාලයේ 160*20 ගොඩනැගිල්ලේ 120*20 කොටස පළමු හා දෙවන අදියර ඉතිරි වැඩ ඉදිකිරීම | දෙහිඕවිට | 7,500.00 | 193,000.00 | C-6 සහ ඉහල | 19,32 |
| Ns-04 | කෑ/දෙහි/නුරිය දෙමළ විද්‍යාලයේ කාර්යාලය හා පුස්තකාල ගොඩනැගිල්ල ඉතිරි වැඩ ඉදිකිරීම | දෙහිඕවිට | 7,500.00 | 172,000.00 | C-6 සහ ඉහල | 17.25 |

**07.** සියළුම ලංසු **2025.09.22** දින දක්වා වලංගු විය යුතුය.

**08.**මෙම සියළු කර්මාන්තයන්ට අදාල පූර්ව ලංසු සාකච්ඡාව **2025.06.04** දින පෙ.ව.**10.30** ට සබරගමුව පළාත් සභා සංකීර්ණයේ පළමු මහලේ පිහිටි අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේදී පවත්වනු ලැබේ. ලංසු කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගී විය හැකිය.

බී.ඒ.සී.පී.බමුණුආරච්චි
සහාපති
ප්‍රසම්පාදන කමිටුව,
ලේකම්
අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා

සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත් සභාව,
නව නගරය, රත්නපුර

**2025.05.26**